BP 328

**<u>මධ්‍යම පළාත් සභාවේ</u>**

**<u>2014 අංක 4 දරන උකස්ගනන්ගේ ප්‍රඥප්තිය</u>**

**<u>ක්‍රියාත්මක වන දිනය 2016.01.01 දින සිට</u>**

බඩු උකස් ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා පිළිපැදිය යුතු නිතිමය විධිවිධාන පහත දැක්වේ

| විධිවිධාන | වෙනත් කරුණු |
|---|---|
| **<u>ලියාපදිංචි කිරීම</u>**<br><br>1 උකස් ව්‍යාපාරයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනිමට අදහස් කරන සෑම තැනැත්තෙක්ම තම ව්‍යාපාරය ආරම්භ කිරීමට පෙර ආදායම් කොමසාරිස්වරයාගෙන් ඒ සඳහා ලියා පදිංචිය ලබාගත යුතුය.<br><br>ලියාපදිංචි ගාස්තුව = රු. 25,000/= | **<u>ඉදිරිපත් කලයුතු ලේඛන</u>**<br><br>1 ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය අයදුම්පත.<br><br>2 නිති විරෝධි ක්‍රියාවක් සිදු නොකළ බවට සහ / හෝ අධිකරණයේදි වරදකට වරදකරුවෙකු නොවු බවට දිවුරුම් ප්‍රකාශයන්.<br><br>3 අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු හෝ නඩුවක් පවතින තැනැත්තෙකු එම නඩුවට අදාළව සියළුම තොරතුරු ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක්.<br><br>ප්‍රඥප්තියේ 8 (3) වන විධිවිධානය පරිදි මෙම මුදල මුදල් අමාත්‍යවරයා විසින් කළින් කළට ගැසට් නිවේදනයක් මගින් නියම කරනු ලැබේ. |
| **<u>වාර්ෂික බලපත්‍ර ලබාගැනිම</u>**<br>1 සෑම ව්‍යාපාරික මධ්‍යස්ථානයක් සහ හෝ ශාඛාවක් සඳහාම වෙන් වෙන්ව බලපත්‍ර ලබාගත යුතුය.උකස් බලපත්‍රයක් ලබා නොගෙන උකස් ගැනීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතුය.<br><br>2 සෑම බලපත්‍රයක්ම එහි සඳහන් ව්‍යාපාර ස්ථානයට සහ ලිත් වර්ෂයට පමණක් වලංගු වන්නේය.<br><br>3 නිකුත් කරන ලද බලපත්‍රයක් වෙනුවෙන් අයෙකුට පැවරීම සඳහා අදායම් කොමසාරිස් වරයාගෙන් ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.<br><br>4 පවත්නා බලපත්‍රය අවලංගුවීමට මාස 2 කට කලින් නව බලපත්‍රය සඳහා අයදුම් කළ යුතුය.<br><br>5 වාර්ෂික බලපත්‍රය නියමිත දිනට අළුත් නොකර ව්‍යාපාරය පවත්වාගෙන යාම වෙනුවෙන්<br>දණ්ඩනය :–<br>1 බලපත්‍ර ගාස්තුව හා සෑම ඉකුත් වු මාසයක් වෙනුවෙන්ම බලපත්‍ර ගාස්තුවෙන් 10% ක ප්‍රමාද ගාස්තුවක්<br><br>6 වාර්ෂික බලපත්‍රය ලබා නොගෙන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම වෙනුවෙන්<br>දණ්ඩනය<br>1 බලපත්‍ර ගාස්තුව හා සෑම ඉකුත් වු මාසයක් වෙනුවෙන්ම බලපත්‍ර ගාස්තුවෙන් 20% ක ප්‍රමාද ගාස්තුවක්<br><br>වාර්ෂික බලපත්‍ර ගාස්තුව – රු. 5,000/= | **<u>වාර්ෂික බලපත්‍ර ලබාගැනිම සඳහා ඉදිරිපත් කළයුතු ලේඛණ</u>**<br><br>1 අයදුම් පත්‍රය.<br><br>2 නිති විරෝධි ක්‍රියාවක් සිදු නොකළ බවට සහ හෝ අධිකරණයේදි වරදකට වරදකරුවෙකු නොවු බවට දිවුරුම් ප්‍රකාශයන් .(7 වගන්තිය)<br><br>3 අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ යම් තැනැත්තෙකු හෝ නඩුවක් පවතින තැනැත්තෙකු එම නඩුවට අදාළව සියළු තොරතුරු ඇතුළත් දිවුරුම් ප්‍රකාශයක්<br>.<br><br>4 ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ සමාගමක් නම් සමාගම ලියාපදිංචි කිරීමේ සහතිකය සහ සාංගමික ව්‍යවස්ථාවලියේ පිටපතක් ( පෙර මුදල් වර්ෂයේ)<br><br>5 පෙර වර්ෂයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශය.<br><br>6 ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පරිදි සම්පූර්ණ ඔඩපනය වටිනාකමට හා ව්‍යාපාරය විවෘතව තබන මුළු කාලසීමාවට පූර්ණ වගකීමක් සහිතවු රරකෂණ ආවරණ |

| | |
|---|---|
| **ඇප තැන්පතුව – රු.100,000/=**<br>සෑම බලපත්‍රලාභියෙකු විසින්ම ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ පළාත් ආදායම් කොමසාරිස් නමින් ඇප මුදල තැන්පත් කළ යුතුය.ව්‍යාපාරය වසා දැමීමේදි හෝ පැවරීමේදි පමණක් මෙය ආපසු ගෙවනු ලැබේ. | ප්‍රඥප්තියේ 10 (3) විධිවිධාන පරිදි මෙම මුදල අමාත්‍යවරයා විසින් කළින් කළට නිවේදනයක් මගින් නියම කරනු ලැබේ. |
| **බලපත්‍රයක් නිකත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථා**<br><br>1 බලපත්‍රය ඉල්ලා සිටින දිනට පෙරාතුව වර්ෂ 5 ක් තුළ, දණ්ඩන නිති සංග්‍රහයේ xi,xiii,xvii.xviii වන ජේද යටතේ සහ/ හෝ<br>2 කිරුම් මිණුම් ආඥාපනත යටතේ සහ / හෝ<br>3 මෙම ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ වරදකට<br>4 වරදකරුවෙකු වී ඇතිවිට සහ /හෝ<br>5 .ලියාපදිංචිය සහ / හෝ බලපත්‍රයක් ලබා ගැනිම සදහා ඉදිරිපත් කළයුතු ලේඛණ ඉදිරිපත් කර නොමැත්තේ නම් සහ/හෝ<br>6 වාර්ෂික ගිණුම් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක සහ /හෝ ;ප්‍රඥප්තියේ 12 වන වගන්තිය යටතේ බලපත්‍රය අවලංගු කරඇත්නම් සහ /හෝ<br>7 පවත්නා බලපත්‍රය වලංගු කාලය ඉක්මවා ගොස් ඇත්නම් හා අනුගාමි වර්ෂයට බලපත්‍රයක් ලබා නොගෙන ඇති බව ප්‍රඥප්තියේ 13 (2) වගන්තිය යටතේ ගැසට් නිවේදනයකින් හා පුවත්පත් දැන්වීම් මගින් නිවේදනය කොට ඇත්නම් සහ /හෝ<br><br>බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන තැනැත්තා වෙන්දේසි කරුවෙකු නම්,<br><br>උකස් බලපත්‍රය නිකුත් කිරීම ආදායම් කොමසාරිස් වරයා විසින් ප්‍රතිකෙෂ්ප කරනු ඇත. | |
| **බලපත්‍රලාභින් විසින් පිළිපැදිය යුතු කොන්දේසි**<br><br>1 තුන්මසකට වැඩිකාලයක් ශ්‍රිලංකාවෙන් බැහැර වීමට අදහස් කරන්නේ නම් ,තමන් වෙනුවෙන් වැඩ කටයුතු කරගෙන යාම සදහා ප්‍රඥප්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනිමට හිමිකම් ඇති තැනැත්තෙකු නම්කර ඒ පිළිබද ආදායම් කොමසාරිස්වරයාගේ ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.<br>2 බඩු උකස් ගන්නෙකුට වෙන්දේසිකරුවෙකු ලෙස ක්‍රියා නොකළ යුතුය. | |
| ප්‍රඥප්තියේ විධිවිධාන පරිදි පවත්වාගෙන යායුතු පොත්පත් ආකෘතිපත්‍ර හා ලේඛණ ආදිය සම්න්ධයෙන් බලපත්‍ර ලාභියා විශේෂ අවධානයකින් කටයුතු කළ යුතුය. | සිංහල, දෙමළ,ඉංග්‍රිසි යන භාෂා 3න්ම සදහන් විය යුතුය. |
| **පොලි අනුපාතය**<br>බඩු අකස්ගන්නෙකු විසින් ඔඩපනයක් මත දෙනු ලබන ණය වෙනුවෙන් මෙම ප්‍රඥප්තියේ 2 වන උප ලේඛණයේ සදහන් අනුප්‍රමාණ ඉක්මවන පොලියක් අය නොකළ යුතුය. | ණයට දෙනු ලබන සෑම රුපියලකින්ම කොටසක් සදහා පොළි අනුප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සදහා ශත 2ට වැඩි නොවිය යුතුය.(2 උප ලේඛණය බලන්න) |

| | |
|---|---|
| **<u>ඔඩපනය වෙන්දේසි කිරීම</u>**<br>ඔඩපනය වෙන්දේසිකිරීම සම්න්ධයෙන් ප්‍රඥප්තියේ 3වන උපලේඛණයේ සදහන් නියෝග බඩු උකස්ගන්නා විසින් පිළිපැදිය යුතුය.<br>ණය පොලිය හා බද්ද ඉක්මවන මුදලකට ඔඩපනය විකිණීමේදි ඊට අදාල කාර්ය පටිපාටිය සම්න්ධයෙන් විශේෂ අවධානය යොමුකළ | ඔඩපනය වෙන්දේසි කිරීමට පෙර ආදායම් කොමසාරිස්වරයාගෙන් ඒ සදහා ලිඛිත අනුමැතිය ලබාගත යුතුය.එලෙස අනුමැතිය ලබාගත් පසු වෙන්දේසි දිනට යටත් පිරිසෙන් දින 14 කට ප්‍රථම දිනය/වේලාව/ස්ථානය සදහන් කර ලිපියක් බඩු උකස් කළ තැනැත්තා වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය.<br>අදාළ කාර්ය අධීක්ෂණය කිරීම ආදායම් කොමසාරිස් වරයා විසින් සිදු කෙරේ. |
| **<u>ව්‍යාපාර ස්ථානය පරීක්ෂා කිරීම</u>**<br>ආදායම් කොමසාරිස්වරයාගේ බලතල මත යම් බඩු උකස්ගන්නෙකු ව්‍යාපාර ස්ථානයකට යම් වේලාවක ඇතුළු වී ඔඩපන/ ගිණුම්/පොත්පත් ලියවිලි පරීක්ෂා කර අවශ්‍ය සටහන් ලියා ගැනිම නිත්‍යානුකුල වන්නේය. | ආදායම් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ලිඛිතව ලබය දෙනු ලැබූ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නිළධාරියෙකු හෝ නිළධාරීන් කණ්ඩායමක් විසින් මෙම බලතල ක්‍රියාත්මක කෙරෙනු ඇත.ඊට ප්‍රතිරෝධය නොදැක්විය යුතුය. |
| **<u>උකස් ගන්නන් විසින් සිදුකරනු ලබන වැරදි</u>**<br>40 වගන්තියේ උප වගන්තියේ මෙම වරදවල් සදහන්වේ. | අදාළ වරදවල් සම්බන්ධයෙන් ආදායම්කොමසාරිස් වරයා විසින් අධීක්ෂණය සිදු කරනු ලැබේ.අධිකරණයක් විසින් ඊට අදාලව පනවනු ලබන දණ්ඩන 44 වගන්තිවල දැක්වේ. |
| **<u>ව්‍යාපාරයේ අයිතිය පැවරීම හා අවසන් කිරීම</u>**<br>බඩු උකස් ගන්නෙකුගේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන තැනැත්තෙකු විසින් ඔහුගේ මරණින් පසු ව්‍යාපාරය පැවැරිය යුතු තැනැත්තා සදහන් කරමින් සාධන පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.හවුල් ව්‍යාපාරයක් විසින් උකස් ව්‍යාපාරයක් කරගෙන යන්නේ නම් ව්‍යාපාරය අවසන් කිරීමේදි උකස් කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අදාල විධිවිධාන හවුල් ගිවිසුමේ ඇතුලත් විය යුතුය.<br>ව්‍යාපාරය යම් දිනයක සිට වෙනත් යම් තැනැත්තෙකුට පැවරීමට අදහස් කරන්නේ නම් එම දිනයට තුන් මසකට පෙර ආදායම් කොමසාරිස්වරයාගෙන් ලිඛිතව ඉල්ලීමක් කළ යුතුය.උකස් ව්‍යාපාරය අවසන් කිරීමට අදහස් කරන්නේ නම් එදිනට තුන්මසකට පෙර ආදායම් කොමසාරිස්වරයා වෙත ඒබ ව දැණුම් දිය යුතුය..ඊට අදාළ විස්තර 46 වගන්තියේ දැන්වේ. | ව්‍යාපාරය පැවරීම සඳහා ආදායම් කොමසාරිවරයාගේ ලිඛිත අවසරය ලබා ගත යුතුය.එසේ නොමැත්තේ නම් ආදායම් කොමසාරිස්වරයා විසින් බලපත්‍රය ලබාදිම ප්‍රතික්ෂේප කරනු ඇත.ලිඛිත ඉල්ලීම ලැබී ලිත් මසක් ඇතුළත තම තීරණය ආදායම් කොමසාරිස්වරයා විසින් ලිඛිතව දැනුම්දෙනු ලැබේ. |
| **<u>හිඟ මුදල් අය කිරීම</u>**<br>මෙම ප්‍රඥප්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් නොගෙවා පැහැරහැරීම සම්බන්ධයෙන් එම හිඟ මුදල් අයකර ගැනිමට අදාල විධිවිධාන ප්‍රඥප්තියේ 51 වගන්තිය යටතේ දැක්වේ. | මෙම ප්‍රඥප්තිය යටතේ අයවිය යුතු යම් හිඟ මුදලක් අයකර ගැනිම සඳහා අදාළ දැන්වීමේ නිශ්චිත සඳහන් දිනයකට පෙර ගෙවිය යුතු බවට බඩු උකස්ගන්නා වෙත හෝ එකී වගකිම දරන්නා වෙත ලියාපදිංචිතැපෑලෙන් ආදායම් කොමසාරිස්වරයා විසින් දැණුම් දෙනු ලබන අතර ,එසේ නොගෙවනලද යම් මුදලක් හිඟ මුදලක් ලෙස සලකාඅයකර ගනු ලැබීමට බලය ඇත්තේය. |